ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# <u>පුවත්පත් නිවේදනය</u>

## ඩිජිටල් පොදු යටිතල පහසුකම් සමුළුව

**Enable I Empower I Enrich**

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ශ්‍රී ලංකා රජයේ තාක්ෂණ අමාත්‍යාංශය හා එක්ව ඩිජිටල් **පොදු** යටිතල පහසුකම් පිළිබඳ සංවිධානය කරනු ලබන සමුළුවක් 2024 මාර්තු 26 වන දින කොළඹ දී පැවැත්වෙනු ඇත. මෙම සමුළුව සේවා සැපයීම යථාර්ථයක් බවට පත් කිරීම, අන්තර්ග්‍රහණීයත්වය ප්‍රවර්ධනය කරමින් ප්‍රජාවන් බලගැන්වීම සහ නව්‍යකරණයට ජවය ලබා දෙමින් ආර්ථිකය පෝෂණය කිරීම සඳහා ඩිජිටල් **පොදු** යටිතල පහසුකම් හි පරිවර්තනීය විභවතාවය ගවේෂණය කරනු ඇත.

2. සමුළුව ආරම්භක සැසියකින් සමාරම්භ වනු ඇති අතර එහි ප්‍රධාන දේශනය ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් සිදු කරනු ඇත. ඉන් අනතුරුව විද්වත් සාකච්ඡා දෙකක් පැවැත්වෙනු ඇත. ‘Accelerating Digital Sri Lanka’ යන තේමාව යටතේ පැවැත්වෙන පළමු සාකච්ඡාව ඩිජිටල් **පොදු** යටිතල පහසුකම් පාලනය පහසු කරන ආකාරය සහ පුරවැසියන් සඳහා ප්‍රවේශය ඉහළ නංවන ආකාරය සම්බන්ධයෙන් අවධානය යොමු කරනු ඇත. ‘Unlocking the Digital Stack’ යන තේමාව යටතේ පැවැත්වෙන දෙවන සමුළුව ස්ටාට්අප්

ඩොමේන්, මැරින්ග් තාක්ෂණය, වෙළඳපොළ සහ පාලනය ඇතුළු නිශ්චිත අරමුණක් ළඟා කර ගැනීම සඳහා ඩිජිටල් **පොදු** යටිතල පහසුකම්හි පද්ධති අන්තර්ක්‍රියාවන් සාකච්ඡා කරනු ඇත.

3. මෙම විද්වත් සාකච්ඡා ද්විත්වය පිළිවෙළින් තාක්ෂණ රාජ්‍ය අමාත්‍ය කනක හේරත් මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂ ද සිල්වා මහතා විසින් ආරම්භ කරනු ඇත. මෙම සාකච්ඡාවන් සඳහා ඩිජිටල් පොදු යටිතල පහසුකම් සහ පාලනය පිළිබඳ විවිධ ක්ෂේත්‍ර සහ දෘෂ්ටිකෝණයන් නියෝජනය කරමින් දැනුම සහ අත්දැකීම් සපිරි ඉන්දීය සහ ශ්‍රී ලාංකික විද්වතුන් රැසක් සහභාගී වනු ඇත. https://youtube.com/live/0mfxUibO3-g?feature=share යොමුව ඔස්සේ සමුළුව මාර්තු 26 වන දින පෙ.ව. 9.30 සිට සජීවීව නැරඹිය හැකිය.

***

*2024 මාර්තු 22*
*කොළඹ*